## 2019 අගෝස්තු මස 05 වන දින සිට 11 වන දින දක්වා

## ප්‍රශංසා එකතු සුපුවත

### "හැරෙන්න සුපුරුදු ගමන නවත්වා "

01. ආරම්භක ප්‍රශංසාව - පුබුදු ගී අංක 03 "ආ එනු මැනේ..."

02. ප්‍රශංසාවට හැඳින්වීම - රෝම 8/ 26

**" එලෙසම ශුද්ධාත්මයාණන් වහන්සේත් අපගේ දුර්වලකමේදී අපට ආධාර දෙන සේක. නිසි ලෙස යාච්ඤා කළ යුත්තේ කෙසේදැයි අපි නොදනිමු. එහෙත් ශුද්ධාත්මයාණන් වහන්සේම වචනවලින් කිය නොහැකි සුසුම්ලෑම්වලින් දෙවියන් වහන්සේ වෙත අප වෙනුවෙන් අයැදින සේක."**

අපගේ දුර්වලකමේදී අපට ආදරය කරමින් අපට සහය වෙමින් අප තුළ වැඩවසන ශුද්ධාත්මයාණන් වහන්සේට ඉඩ දෙමින් අද දවසේ ප්‍රශංසාවට ඇතුළු වෙමු. අපගේ දුර්වලකම, පාපීබව නොතකා අපට ප්‍රේම කරන්නට තරම්ම කොන්දේසි විරහිතව අපට ප්‍රේම කරන, සමාව දෙන දෙව් මහෝත්තමයාණන්ට ප්‍රශංසා කරමු. කඳුල, සුසුම්ලෑම, අසරණකම, වේදනාව තුළම තනිවූ ඔබ/ මා වෙනුවෙන් දෙවියන් වහන්සේ ඉදිරිපිට යළිත් ශුද්ධාත්මයන් සමඟ ඔවුන් වහන්සේ පසසමු.
පුබුදු ගී අංක 19 " අප ජීවනයද ........ "

03. දවසේ සුපුවත - එළිදරව්ව 3/ 15-16, 19

**" මම ඔබේ ක්‍රියා දනිමි. ඔබ ශීතල ගතියෙන් වත්, උණුසුම් ගතියෙන් වත් නොසිටින බව මම දනිමි. ඔබ ශීතලව හෝ උණුසුම් ව හෝ සිටියා නම් මම කැමැත්තෙමි. ඔබ උණුසුම්ව හෝ ශීතලව හෝ නොසිට, ඇල්මැරී සිටින බැවින් මම මාගේ මුඛයෙන් ඔබ වමාරන්නෙමි."**
**" මා ප්‍රේම කරන සියල්ලන්ට තරවටු කර මම ඔවුන් හික්මවමි . එබැවින් උද්යෝගිමත්ව, පසුතැවී සිත්හරවා ගන්න. "**

04. සාකච්ඡාව සඳහා -

* ඉහත සඳහන් ශුද්ධ ලියවිලි පාඨ දෙක ඇසුරින් කිතුනුවකු සතුවිය යුතු ජීවිත පැවැත්ම පිළිබඳ අපගේ අවධානය යොමු කරනු ලබයි. දේව රාජ්‍ය ප්‍රකාශ කිරීමේ දූත මෙහෙවරට කැඳවනු ලැබූ ඔබෙන්/ මගෙන් දෙවියන් වහන්සේ බලාපොරොත්තු වන ජීවිත සාක්ෂිය පිළිබඳ අත්දැකීම ලඟ සිටින කෙනෙකු සමඟ බෙදා ගන්න.
* දේව රාජ්‍ය ප්‍රකාශ කිරීමේ දූත කාර්යයේ නියෙලෙන සියළු දෙනාගෙන් දෙවියන් වහන්සේ බලාපොරොත්තු වන ජීවිත පැවැත්ම ඇල්මැරුණු, මලානික, පසුබසින, අබල, දුබල තත්ත්වයක් නොව. උද්යෝගිමත්, පිරිපුන්, ශක්තිමත්, ධෛර්යවත් ජීවිත පැවැත්මකි.
* දේව රාජ්‍ය තමන් වහන්සේගේ මුළු ජීවිත පැවැත්මම කරගත් ජේසු සමිඳාණන් අනුව ගමන් කරන්නට කැඳවීමලත් ශ්‍රාවක සංඝයද ඔවුන් අනුගමනය කරන කිතුනු සංඝයන්ද එම ජීවිත පැවැත්ම තුළ ජීවත් වීම දේව කැමැත්තයි. එම නිසාම ඔවුන් වහන්සේ ප්‍රකාශ කරන වදන් අපට අභියෝගයක් නොවන්නේද? 'ඔබ උණුසුම්ව හෝ ශීතලව හෝ නොසිට,ඇල්මැරී සිටින බැවින් මම මාගේ මුඛයෙන් ඔබ වමාරන්නෙමි.'
* දෙවියන් වහන්සේට ප්‍රේම කරන සියල්ලන්ට හැම විටම තරවටු කරමින් ඔවුන් හික්මවන සමිඳාණන් වහන්සේ දේව රාජ්‍ය ප්‍රකාශ කරන්නට නම් පසුතැවී සිත් හරවා ගත යුතු බවද මතක් කර දෙයි. හික්මවීම තුළම ඇති වන සන්සුන් බව, පැහැදිලි කම උද්යෝගිමත්ව දේව රාජ්‍ය ප්‍රකාශ කරන්නට අපට ශක්තිය සපයයි.

05. අප දෙසට

* අප, අප දෙසට හැරී බලමු. ඔබ / මම සිටින්නේ උණුසුම් ගතියෙන්ද ? ශීතල ගතියෙන්ද ? නැත්නම් උණුසුම්වත් , ශීතලවත් නොමැතිව දෙවියන් වහන්සේ විසින් වමාරන තත්ත්වයකද?
* දෙවියන් වහන්සේ විසින් හික්මවන ගමනකට ඇතුළුවන්නට පසුතැවී සිත්හරවා ගත් කෙනෙකු වෙමින් උද්යෝගිමත්ව දේව රාජ්‍ය ප්‍රකාශ කරන්නට සූදානම් වෙමු.

06. අවසාන ප්‍රශංසාව

පුබුදු ගී අංක - 291 " හැරෙන්න සුපුරුදු ගමන නවත්වා ... "

=========================

## 2019 අගෝස්තු මස 12 වන දින සිට 18 වන දින දක්වා

## ප්‍රශංසා එකතු සුපුවත

## "ශුද්ධාත්ම ගින්නෙන් ඇවිලෙමින් අවුලමු"

01. ආරම්භක ප්‍රශංසාව - පුබුදු ගී අංක 01 "පිය පුත් සුදතුම්..."

02. ප්‍රශංසාවට හැඳින්වීම : රෝම 8:28-30

**"තවද දෙවියන් වහන්සේගේ අදහස ලෙස කැඳවනු ලැබූවන්ට, එනම් ඔවුන් වහන්සේට ප්‍රේම කරන අයට , සියල්ලෙහිදී ම ඔවුන් වහන්සේ ඔවුන්ගේ යහපත පිණිස ක්‍රියා කරන බව අපි දනිමු...."**

මුළු පොළෝ තලයම මවා වදාළ මහෝත්තම වූ දෙවි සමිඳාණන් වහන්සේ, තමන් වහන්සේම කැඳවනු ලැබූවන් කෙරෙහි දක්වන ප්‍රේමය අසීමසිත ය. පියකුමෙන් - මවකමෙන් පිතෘක - මාතෘක සෙනෙහස දක්වමින් සිය තෝරා ගත් ජනතාව පෝෂණය කරන සේක. රැකබලා ගන්නා සේක. ඔවුනගේ ජීවිත තුළ සිදුවන සියළුම යහපත, අයහපත දන්න, දකින ඔවුන් වහන්සේ සියල්ලේදී ම ඔවුන්ගේ යහපත පිණිස ක්‍රියා කරන සේක. ඔබත් / මමත් තෝරාගත් ජනතාවකි. කැඳවනු ලැබූ ජනතාවකි. අපද අපගේ ජීවිත තුළ සියල්ලේදී යහපත කරන දෙවි සමිඳාණන් හට හදපිරි සතුටින් ප්‍රශංසා කරමු.
පුබුදු ගී අංක 99 "නිති අප සුරකින..."

03. ආපසු බැලීම :
පසුගිය සතියේ අත්දැකීම් බෙදා ගනිමු.

04. දවසේ සුපුවත : ශු.ලූක් 12:49-50

**"පොළොව මත ගිනිලන්න ආවෙමි. ගින්න දැනට ම ඇවිළී තිබේ නම් කොපමණ හොඳද? මට එක්තරා බව්තීස්ම ස්නාපනයක් ලබන්න තිබේ; එය ඉටුවන තුරු මම දැඩි සිත් වේදනාවෙන් පසු වෙමි."**

* ඔබ සවන් දුන් ශුද්ධ ලියවිලි පාඨය හරහා අනාවරණය වන ජේසු සමිඳාණන්ගේ අභ්‍යන්තරික අත්දැකීම ළඟ සිටින කෙනෙකු සමඟ බෙදා ගන්න.
* "පොළොව මත ගිනිලන්න ආවෙමි. ගින්න දැනටම ඇවිළී ඇත්නම් කොපමණ හොඳද?" දේව රාජ්‍යය පිළිබඳ දැවෙන පිපාසයකින් යුතුව කථා කරන අප සමිඳාණන් වහන්සේ ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පිරී සිටි අයුරු මේ ප්‍රකාශනයෙන් පැහැදිලි වේ.
* ඒ ගින්න ශුද්ධාත්ම ගින්නයි. ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය තුළ ඔවුන් වහන්සේ සිදු කළාවූ සෑම ක්‍රියාවක් තුළින්ම, ප්‍රකාශ කළාවූ සෑම වදනක් තුළින්ම මේ ගින්න ඇවිලුනු කෙනෙකු සතු පිපාසය, අවදිවීම, කැපවීම විද්‍යාමාන විය.
* මේ ශුද්ධාත්ම ගින්න නිකන් ඇවිලෙන්නේ නැහැ. ගින්න ඇවිලුනු ජේසු සමිඳාණන් වහන්සේට සිදු වුනා කුරුසියේ මරණය දක්වාම දුක්විඳින්නට, පහර කන්නට, ප්‍රතික්ෂේප වන්න, නින්දා කරනු ලබන්නට.
* මරණයටවත් නිවන්නට නොහැකි වූ ශුද්ධාත්ම ගින්නෙන් ඇවිළුනු අප සමිඳාණන් වහන්සේගේ උත්ථානය හරහා සකල ලෝකවාසීන් වෙතම මේ ගින්න ඇවිලෙන්නට විය. මුළු ලෝකයම උත්ථානවූ සමිඳාණන් වහන්සේව හමුවෙමින් මේ ගින්නෙන් ඇවිලෙමින් සාක්ෂි දරන්නට යොමුවූයේ ශුද්ධාත්ම ගින්නෙන් දැවුනු අප සමිඳාණන් වහන්සේ දෙස බැලීමෙනි.

05. අප දෙසට :

* ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළම ඔබ / මා තුළ ශුද්ධාත්ම ගින්න ඇවිලෙන්නට පටන් ගැණිනි. අභිවෘද්ධිආලෝපය සක්‍රමේන්තුව තුළින් ඒ ගින්න දැල්වී දැල්වී ඇවිළෙන්නට විය. පිබිදුනු කිතුනු ජීවිතය තුළ නිතර නිතර අපට ලබන්නට ඇති ශුද්ධාත්ම ස්නාපනය තුළ මේ ගින්න අප හදවත් දවාලයි.
* ශුද්ධාත්ම ගින්නෙන් ඇවුළුනු කෙනෙකු ලෙස අපේ ප්‍රතිචාරය, ජීවිත සාක්ෂිය කෙසේද?
* දේව රාජ්‍යය කෙරෙහි දැවෙන පිපාසයක් ඔබට / මට තිබේ ද?
* දුන්විඳීම, ප්‍රතික්ෂේපය, නින්දා කරනු ලැබීම, වරදවා වටහා ගැනීම තුළද ක්‍රිස්තුන් වහන්සේ අත්දුටු ඒ පුදුමාකාර පිපාසය, ශුද්ධාත්ම ගින්නෙන් ඇවුළුනු කෙනෙකු ලෙස සාක්ෂි දැරීමේ වරය ඔබ ජීවිතය තුළ අත්දකිනවා ද?
* අප තුළ ඇවිලී ඇති ශුද්ධාත්ම ගින්න කිසිවකුට කිසිවකට නිවන්නට ඉඩ නොදී ගැඹුරු පිපාසයකින් යුතුව දේව රාජ්‍යය ප්‍රකාශ කරමු.

06. අවසාන ප්‍රශංසාව - පුබුදු ගී අංක 49 "යන්න සැරසෙමු..."

========================

## 2019 අගෝස්තු මස 19 වන දින සිට 25 වන දින දක්වා

### ප්‍රශංසා එකතු සුපුවත
### "නිශ්චල වන්න මම දෙවිඳුන් බව දැනගන්න "

01. ආරම්භක ප්‍රශංසාව - පුබුදු ගී අංක 06 "ශුද්ධාත්මයාණෙනි ජීවනයෙනි..."

02. ප්‍රශංසාවට හැඳින්වීම : ගීතාවලිය 96:1-2

**"සමිඳුන් හට නව ගීයක් ගයන්න;**
**පොළෝ වැසි සියල්ලෙනි,**
**සමිඳුන් හට ගී ගයන්න.**
**සමිඳුන් හට ගී ගයා,**
**එතුමන්ගේ නාමයට ආසිරි පතන්න;**
**එතුමන්ගේ ගැළවීමේ ශුභාරංචිය**
**දිනෙන් දින ප්‍රකාශ කරන්න."**

දේව ජීවිතය මිහිමත පතළ කරන්නට කිතු සමිඳාණන් තුළින් කැඳවීම ලැබූ අප කොතරම් වාසනාවන්ත ද? සමිඳුන් හට නව ගීයක් ගයන්නට හැකි නව ජීවිතයක් ලැබූවන් ලෙස ඔවුන් වහන්සේට ප්‍රශංසා කරමු. ඔවුන් වහන්සේගේ ගුණ වනමු. කිතු සමිඳාණන් ගෙනා ගැළවීමේ ශුභාරංචිය දිනෙන් දින ප්‍රකාශ කරන්නට බලය පතමු.
පුබුදු ගී අංක 165 "සමිඳුන් හට තුති ගී ගයලා..."

03. ආපසු බැලීම - පසුගිය සතියේ අත්දැකීම් බෙදා ගන්න.

04. දවසේ සුපුවත : ගීතාවලිය 46:10

**"නිශ්චල වන්න මා දෙවිඳුන් බව දැන ගන්න"**

හෙබ්‍රෙව් 4:12

**"දෙවියන් වහන්සේගේ වචනය ජීවමාන ය; ක්‍රියාශීලීය; දෙමුවහත් කඩුවකටත් වඩා තියුණු ය. ආත්මය ප්‍රාණ වායුවෙන් ද, සන්ධි ඇටමිදුළු වලින් ද වෙන් කරන තරම් විනිවිද යන්නේ ය. සිතේ සිතුවිලි ද අරමුණ ද විමසන්නේ ය."**

* ඉහත ශුද්ධ ලියවිලි පාඨ දෙක භාවනා කිරීමෙන් දෙවියන් වහන්සේගේ වචනයට ඇති බලය අත්දකින්නට අපව යොමු කරයි. 2018 වසර පුරාම ජීවත් වන්නට අපට ලැබුණු තේමාව ද **"ඔබ වහන්සේගේ වචනය ද කැමැත්ත ද ගින්නකි; ආශිර්වාදයකි."**

05. ළඟ සිටින කෙනෙකු සමඟ බෙදා ගන්න.

i ඔබ ඔබේ ජීවිතය තුළ දෙවියන් වහන්සේගේ වචනයට ඇති බලය ඔබ අත්දකිනවා ද?
ii "නිශ්චල වන්න මම දෙවිඳුන් බව දැන ගන්න" යන බලගතු වචනය ඔබේ ජීවිතයේ ඔබ කොතෙක් ඇත්දැක තිබේද?

* දෙවියන් වහන්සේගේ වචනය අපේ හදවත් ගිනි අවුලයි, දවාලයි ජීවමාන කරයි. අපව ක්‍රියා කරන්නන් බවට පත් කරයි.
* දෙවියන් වහන්සේගේ වචනය තුළ ජීවත් වන්නන් තුළින් වචනයාණන් වන ක්‍රිස්තුන් වහන්සේව අන් අයට දැකගත හැකි වෙයි.
* අප අත්දකින විවිධ වූ අභියෝග, ප්‍රශ්න, අරගල තුළ දෙවියන් වහන්සේට ඉඩ දෙමින් නිශ්චලව සිටින්නට හැකි නම් නිශ්චල වන්න. මම දෙවිඳුන් බව දැනගන්න යන මහා සත්‍යතාවය අත්දකින්නට අපට හැකිවේ.

06. අප දෙසට :

* ජීවිත සිදුවීම් තුළ දෙවියන් වහන්සේගේ වචනය සොයමු.
* දේව වචනය කෙරෙහි ගැඹුරු පිපාසයක් ඇති කර ගනිමු.
* දේව වචනය අපේ ජීවිතයට ගෙන දෙන අභියෝගය ඉදිරිපිට පෙනී සිටිමින් සාක්ෂි දරමු.
* දේව වචනයට, දේව හඬට සවන් දෙන්නට දිනපතා මගේ පැයට ඇතුළු වෙමු.

07. අවසාන ප්‍රශංසාව - පුබුදු ගී අංක 58 "සත්‍යතාවේ ආත්මයාණන්..."

======================